**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

AAT/ 234/2019 (NPC)

**අයි.බී.වී.සමන් කුමාර ධර්මදාස**

අභියාචක

එදිරිව

ජාතික පොලිස් කොමිෂන් සභාව

වගඋත්තරකරු

**දිනය :- 2025.05.19**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමලත් රජයේ සේවක ටී.ගුණතිලක මහතා.

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක මාලා බස්නායක මිය.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා.**

**-<u>නියෝගය</u>-**

අභියාචක අයි.බී.වී.සමන් කුමාර ධර්මදාස නැමැති අය විසින්, 2019.10.07 වෙනි දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනයේ සඳහන් කර ඇත්තේ, 2009.02.19 වෙනි දිනය වන විට ඔහු කුරුණෑගල පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කළ බවයි. එම අභියාචනයේ ඔහු විසින් තවදුරටත් සඳහන් කර ඇත්තේ, 2019.02.15 වෙනි දින ඔහු කුරුණෑගල පොලිස් ස්ථානයේ ප්‍රධාන දොරටුවේ ආරක්ෂක රාජකාරි කරමින් සිටියදී, පොලිස් නිලධාරියෙකු විසින් මුදල් පසුම්බියක් ඔහු අතට දී, එය බස් රථයකයින් වැටී තිබෙන බව පවසා සිටි බවයි. ඉන් අනතුරුව ඔහු විසින් එම

මුදල් පසුම්බිය පොලිස් ස්ථානයේ පිළිගැනීම් නිලධාරිනිය වෙත භාරදුන් බවට සඳහන් කර ඇත.

ඉහත කී මුදල් පසුම්බිය සොරකම් කරන ලදැයි සඳහන් කරමින් අභියාචක වෙත චෝදනා පත්‍රයක් ගොනු කර ඇත. අභියාචක වෙත ඉදිරිපත් කරන ලද චෝදනා සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණය අවසානයේ දී, ඔහු වෙත එල්ල වී තිබූ ප්‍රථම චෝදනා දෙකට ඔහු වරදකරු බවට තීරණය කර ඇත. ඒ තීරණය මත ක්‍රියා කරමින් එවකට සිටි පොලිස්පතිවරයා විසින් අභියාචක සේවයෙන් පහකර ඇත. එකී පොලිස්පතිගේ තීරණයට විරුද්ධව අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එකී අභියාචනය සළකා බැලූ එකී කොමිෂන් සභාව විසින් ඔහුගේ අභියාචනය ප්‍රතික්ෂේප කරමින්, ඒ බව 2019.08.08 දිනැති ලිපිය මගින් අභියාචක වෙත දන්වා යවා ඇත. එකී තීරණයෙන් අතෘප්තියට පත් අභියාචක මෙම විනිශ්චය අධිකාරිය වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත.

මෙහිදී සළකා බැලිය යුතු වන්නේ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, අභියාචක වෙත ලබා දී ඇති 2019.08.08 දිනැති තීරණයේ නිරවද්‍යතාවයයි. ඉහතකී තීරණය ලබා දී ඇත්තේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කරන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව ලබා දී ඇති නිගමනය මතය.

අයි.ඒ. ස්වර්ණලතා යන අය 2009.02.15 වෙනි දින ඇයගේ මුදල් පසුම්බිය සොරා ගැනීම සම්බන්ධයෙන් කුරුණෑගල පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර ඇත. එම පැමිණිල්ල සම්බන්ධයෙන් මෙම අභියාචකට විරුද්ධව කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව මහේස්ත්‍රාත් අධිකරණයේ දි චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා පත්‍රය මත නඩුව විභාගයට ගැනීමෙන් අනතුරුව කුරුණෑගල මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ඉහතින් සඳහන් ස්වර්ණලතා සහ අභියාචක අතර මෙම කරුණ සමථයකට එළඹී ඇති බැවින්, ඉදිරිපත් කර තිබූ චෝදනාව සංශෝධනය කරමින්, දෙපාර්ශවයම සමථයට පත්කර ඇත. එකී සමථය කුරුණෑගල

මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ 2010.05.05 වෙනි දින වාර්තා කර ඇති අතර, එම කරුණ දක්වෙන කාර්ය සටහන අභියාචක විසින් ම මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇත. එකී කාර්ය සටහන පහත දැක්වේ.

<u>2010.05.05</u>

**"චූ.අයි.බී.ඩබ්.පී.සමන් කුමාර සිටී,**

**පැ.සා. 1, 2 සිතාසි නිකුත් කර ඇත. වාර්තා නැත.**

**පැ.සා.01, 02 සිටී,**

**පැ.සා.01 ට නි. නවීන් ධර්මදාස මයා,**

**පැමිණිල්ලට පො.සැ.20362 ජයරත්න සිටී. චූදිතට නී.දුනුසිංහ මහතා පෙනී සිටී. පැ.සා. 1 ගේ ඉල්ලීම මත, ලං.ද.නි.සං 386 වග. යටතේ සමථයට පත්වීමට අවසර පතයි. කරුණු සළකා බලා ඉල්ලීමට ඉඩදෙමි. දෙපා. නඩු වාර්තාව අත්සන් තබයි.**

**අ/ක -**

**මහේස්ත්‍රාත්.**

**චූදිත - අ/ක**

**සාක්ෂි :- 1 අ/ක.**"

ඉහත කී කාර්ය සටහන පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ පාර්ශවකරුවන්ගේ ඉල්ලා සිටීම මත මෙම සිද්ධියට අදාළ කරුණ සමථයට පත්වීමට ඉඩ ලබා දී ඇති බවයි. නමුත් එම අධිකරණය විසින් මෙම අභියාචක නඩුවෙන් නිදහස් කිරීමක් පිළිබඳව සඳහන් කර නැත. ඒ අනුව මෙම නඩුවෙන් චූදිත අධිකරණයෙන් නිදහස් කර ඇති බවට අභියාචක විසින් ඉදිරිපත් කර ඇති කරුණ ඒ අයුරින්ම පිළිගත නොහැකිය.

කෙසේ වෙතත්, කිසියම් චෝදනාවක් සමථයට පත්වී ඇත්නම්, එයින් පෙනී යන්නේ චෝදනා ලත් පුද්ගලයා එම සිද්ධිය ප්‍රතික්ෂේප නොකරන බවයි. චෝදනා

ලත් පුද්ගලයා චෝදනාව ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඒ බව නඩු වාර්තාවේ පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය. මෙහිදී එවැන්නක් දක්නට නොමැත.

කෙසේ වෙතත් අභියාචකට එරෙහිව පැවති විනය පරීක්ෂණය අවසානයේ දී, අභියාචක වරදකරු කරමින් ලබා දී ඇති තීන්දුවේ නිරවද්‍යතාවය සළකා බැලීම අවශ්‍යවේ.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2019.10.07 වෙනි දිනැති අභියාචන පෙත්සමේ සඳහන් කර ඇත්තේ, ඔහු ආරක්ෂක රාජකාරි කරමින් සිටියදී බස් රථයකින් පැමිණි පොලිස් නිලධාරියෙකු විසින් මුදල් පසුම්බියක් ඔහු වෙත ලබාදීමෙන් පසු, එම මුදල් පසුම්බිය පොලිස් ස්ථානයේ පිළිගැනීමේ නිලධාරිනියට ඔහු විසින් භාරදුන් බවයි. ඒ අනුව පැහැදිලි වන්නේ ඉහත කී දින කිසියම් අයෙකුගේ මුදල් පසුම්බියක් සොරකම් කර ඇති බව අභියාචක තර්ක නොකරන බවයි. එකී තත්ත්වය යටතේ මෙම සොරකම සඳහා අභියාචකගේ සහභාගීත්වයක් තිබේදැයි පරීක්ෂා කර බැලිය යුතුවේ.

සොරකමට භාජනය වූ ස්වර්ණලතා යන අය විධිමත් විනය පරීක්ෂණය සඳහා සාක්ෂි දී නැත. ඇයව සාක්ෂියට කැඳවා තිබූ නමුත් පැමිණ සිට නැත ආනන්ද ජනකසිරි කුමාර යන පොලිස් නිලධාරියා විනය පරීක්ෂණයේ දී සාක්ෂි දෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

> **"මා පොලීසිය ලඟ බස් නැවතුමෙන් බැස පොලීසියට යන විට මා දුටුවා එම බස් රථයේ පැමිණි සමන් නිලධාරියා ද ඉදිරි දොරෙන් බැස කුරුණෑගල පොලීසිය දෙසට දුවගෙන යනවා. මා දුටුවා සමන්ගේ අතේ කහපාට ඉටි බෑගයක් තිබුණා. ඒ සමගම බස් නැවතුම් පොල ලඟ සිටි කාන්තාවක් කෑගැහුවා අර දුවන රාළහාමී මගේ බෑග් එකෙන් සල්ලි ගත්තා. පිටි පොකට් ගැහුවා කියලා. මෙම බස් රථයේ නිල ඇඳුමින් වෙනත් කිසිදු පොලිස් නිලධාරියෙකු සිටියේ නැත. මා දුටුවා මෙම සමන් නිලධාරියා පොලිස් ස්ථානයේ බැරැක්කය දෙසට දුව යනවා. වැඩිදුරටත් මෙම කැගහපු**

**ගැනූ අය මට කිව්වා අර දුවන රාළහාමි තමයි මගේ පර්ස් එක පොකට් ගැහුවේ කියා. මා එවිට උදේ වරුවේ මා යන විට මෙම ගේට්ටුවේ සිටි නිලධාරීන්ගෙන් අයෙකු මෙම සමන් යන අය බව හඳුනා ගත් අතර, ඒ වෙලාවේ ඔහු සිටියේ නැත. මා මේ සම්බන්ධයෙන් මූ.පො.ප. තුමාට සිද්ධිය සම්බන්ධව දැනුවත් කලෙමි. මා මෙම සිද්ධිය සම්බන්ධයෙන් 2009.03.26 වන දින පොලිස් අධිකාරි කාර්යාලය කුරුණෑගල දී සහකාර පොලිස් අධිකාරි කුරුණෑගල 1 සේනාරත්න මහතාට මූලික විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දුන්නා."**

ඉහත කී සාක්ෂිකරු ගෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර, එම ප්‍රශ්න වලට පිළිතුරු ලෙසින් ඔහු ඉහත සඳහන් සාක්ෂිය තහවුරු කරමින් සාක්ෂි දී ඇත. ඒ අනුව ජනකසිරි කුමාර යන අයගේ සාක්ෂිය ප්‍රතික්ෂේප කළ නොහැක.

අයේෂා දිසානායක නැමැති සාක්ෂිකාරිය ඉහත සාක්ෂිය තහවුරු කරමින් පවසා ඇත්තේ ඇය සේවය කළ ස්ථානය සහ ප්‍රධාන තාප්පය අතර දුර අඩි 4ක් පමණ බවත්, අභියාචක විසින් 2009.02.15 වෙනි දින පැය 10.45ත්, 11.00ත් අතර කාලයේ දී "**නංගී මම තේ එකක් බිලා එන්නම් කියා**" ඉස්සරහ කඩයට යන බව කියා පිටත්ව ගිය බවයි. අනතුරුව පැය 1/4ක්, 1/2ක් පමණ ගිය පසු අභියාචක ඉතා කලබලයෙන් ඇය ලඟට පැමිණ පොකට් ගහපු පර්ස් එකක් අහුලා ගත්තා, කවුරුහරි ආවොත් දෙන්න කියලා මා සිටි මේසයට දමා ඔහු බැරැක්කය පැත්තට ගිය බවත්ය. ඇයද හරස් ප්‍රශ්න වලට භාජනය වී ඇති අතර, ඇය විසින් ලබා දී ඇති ඉහත සඳහන් සාක්ෂිය ද ඒ මගින් බිඳ හෙළා නැත.

ඉහත සඳහන් සාක්ෂි එකිනෙකට තහවුරු වන අතර, ඒ අනුව ඒවා පිළිගත යුතුවේ. අභියාචක විසින් විනය පරීක්ෂණයේ දී සාක්ෂි ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. එම ක්‍රියාව හේතුවෙන් ඔහුගේ නිර්දෝෂීභාවය තහවුරු කිරීමට එය බාධාවක් නොවුවද, එම අවස්ථාවේ ඔහු සාක්ෂි දෙමින් කරුණු ඉදිරිපත් කළේ නම්, ඔහුගේ නිවැරදි භාවය තහවුරු කිරීමට එය ඉවහල්වීමට ඉඩ ප්‍රස්ථාව තිබිණි.

ඉහත කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ අභියාචකට එරෙහිව පැවැති විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව ලබා දී ඇති තීරණයෙහි දෝෂයක් නොමැති බවයි. එබැවින් එකී තීරණය මත ක්‍රියා කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අභියාචකට එරෙහිව ලබා දී ඇති තීරණයෙහි දෝෂයක් පෙනෙන්නට නැත.

ඉහත කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි,
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-